දේම වැරදියි කියන්න මං ඉක්මන් වෙන්නෙ නැහැ අක්කා.. ඒත් මං වෛද්‍යවරයෙක් හැටියට ඔයාගෙන් ඉල්ලන්නෙ ආයෙම වතාවක් මේ තීරණය ගැන හිතන්න කියන එකයි.. " ඔහු නැවත වතාවක් කිවේ ය.

"නිමන්තයිය මොකද කියන්නෙ..?" චතුරි පළමු වතාවට ඇසුවා ය.

"මං එයාට කිව්වෙ නැහැ.." අමන්දි වහා කීවා ය.

"කිව්වෙ නැහැ...!! ඒ මොකද..? ඒ ළමය එක්කනෙ ඉස්සෙල්ලම කතා කරන්න ඕනෙ.." අම්මා අසන්නේ විශ්මයෙනි. අමන්දි ඇයට පිළිතුරක් දෙන්නට නොසිතුවා ය. මේ කිසිවක් ඇයට තේරුම් කර දිය නොහැකි ය. නිමන්ත හා තමා අතර ඇතිවී ඇති මහා පරතරය ඇයට කෙසේ නම් තේරුම් කර දෙන්න ද? තමා ගත් තීරණය ඔහුට කිව යුතු බව ඇය දනියි. එය යුතුකමකි. එනමුදු මාස ගණනාවක් තිස්සේ ගොඩනැගුණ මේ උස් බාධකය කෙසේ නම් පහසුවෙන් බිඳ දමන්නද?

***<u>වළාකුළින් බර වූ නිල් අහසක් පසුබිමින් ඇති කඳු පන්තිය දක්ෂ සිත්තරෙකුගේ නිමැවුමක් යයි ශානිකාට සිතෙයි. ළඟින්ම ඇති කන්ද මත සිත්තම් කර ඇති හුදකලා ගස් දෙක සිත්තමට යම්කිසි අරුතක් එක් කර ඇති සෙයකි.</u>***

අම්මා තවමත් පිළිතුරක් බලාපොරොත්තුවෙන් බලා සිටියි.

"කියන්න ඕනෙ.." අමන්දි කෙටි පිළිතුරක් දුන්නා ය. එයින් අම්මා සෑහීමකට පත් නොවන්නට ඇති නමුත් නැවතත් ප්‍රශ්න නොකිරීම ඇයට සහනයක් විය.
අමන්දි නැවතත් අම්මා ගේ උරහිසට බර වූවා ය.

00000

බොහෝ දිනකට පසු විශ්වජිත් කලාගාරයේ සිටිනු දැකීම ශාමිලා ගේ සිතට ගෙන ආවේ මහත් සැනසීමකි. ඔහු ඇය ආ බව නොදුටුවා සේ ඊසලයක් මත රැඳවූ අපූරු සිත්තමක් නරඹමින් සිටියේ ය.

වළාකුළින් බර වූ නිල් අහසක් පසුබිමින් ඇති කඳු පන්තිය දක්ෂ සිත්තරෙකුගේ නිමැවුමක් යයි ශානිකාට සිතෙයි. ළඟින්ම ඇති කන්ද මත සිත්තම් කර ඇති හුදකලා ගස් දෙක සිත්තමට යම්කිසි අරුතක් එක් කර ඇති සෙයකි.

"ලියුම් පෙට්ටියේ ලියුම් පිරිලා.. මේ බලන්න.." ශාමිලා තමා අතේ වූ ලියුම් මිටිය මේසය මත තැබුවා ය. ඔහු ඇය දෙස හැරී බලා සිනාසුණේ ය. බොහෝ කලකට පසු ඔහුගේ සැහැල්ලු සිනාව දකින්නට ලැබීම සතුටකි."... කාගෙද සර් පේන්ටිං එක.. හරිම ලස්සනයි.."

ඔහු පිළිතුරක් නොදුන්නේ ය.

"ගස්වල පැත්තක කොළ උඩට ඉර එළිය වැටිලා තියෙනවා පේන්ට් කරලා තියෙන හැටි හරිම තාත්විකයි... ආලෝකයයි අඳුරයි හරිම ලස්සනට බැලන්ස් කරලා තියෙනවා.. මං දැන් අවුරුදු ගාණක් තිස්සෙ ඉගෙනගත්තත් තාම මට බැහැනෙ ස්වභාවික දර්ශන මේ වගේ පේන්ටිං කරන්න.." ශාමිලා සිත්තම රසවිඳිනයුරු විශ්වජිත් බලා සිටියේ සතුටකිනි. අමන්දි සැබෑම දක්ෂ සිත්තරියක බවට විවාදයක් නැත. ඉතා කුඩා මගපෙන්වීමක් පමණක් ලබා ඇය මේ තරම් දියුණුවක් ලැබුවේ සහජ දක්ෂතාව නිසා විය හැකි ය. අවුරුදු ගණනක් උගත්තද සහජ දක්ෂතාවට ඒ දැනුම පරදවන්නට ඇත්තේ විසල් ඉඩකඩක් බව විශ්වජිත් දැන සිටියේ ය.

"මං සර්ට තේකක් හදන්නං.. උදේට කෑවද..?" ශාමිලා ඇසුවේ පැන්ට්‍රිය වෙත යන අතර ය.

"පුලුවන්නං මට ඉඟුරු තේකක් හදන්න.. ටිකක් වැඩියෙන් ඉඟුරු දාලා.. වැඩි සීනි" ඔහු කීවේ ය.

ඇය ඉතා ඕනෑකමකින් ඔහුගේ තේ කෝප්පය පිළියෙල කළා ය. එය දෝතින්ම ඔහුට පිළිගැන්නුවා ය. මොහොතකට ඇගේ ඇඟිලිතුඩු ඔහුගේ ඇඟිලි තුඩු හා ගැටුණි. ඒ සිසිලස ගින්දර-ක් මෙන් ඔහුගේ සිත දවාලූයේ ය.







"ඇත්ත කියන්න.. ඔයාට අල්තීනා මතක් වුණේ නැද්ද..? කව්ද ඔයාගෙ අල්තීනා..? ගුරුතුමාට හිත යටින් ආදරය කළ අල්තීනා.. " අමන්දි ඇසූ හැටි විශ්වජිත්ට සිහිපත් විය. මෙතෙක් කාලයකට ශාමිලා හමුවේ දී සිතට නොදැනුණ අපහසුවක් පළමු වතාවට ඔහුට දැනුණි. ශාමිලා ගේ මේ හෘදයාංගම හැසිරීම තමාට කලින් නොදැනුණේ මන්දැයි ඔහුට සිතාගත නොහැකි විය. ඇය සිය ගුරුවරයාට සිත යටින් ආදරය කළ අල්තීනාවක් වී ද? එසේ වේ නම් ඇයට අනුබලයක් නොදිය යුතු යයි ඔහු සිතුවේ ය. එය මේ අහිංසක දැරිය ගේ සිතට වේදනාවක් ගෙන දෙනු ඇති බව ඔහු දනියි. එනමුදු ඇගේ සිතට අනවශ්‍ය බලාපොරොත්තු ඇතිකරගන්නට ඉඩ දිය යුතු නොවේ. බලාපොරොත්තු බිඳ වැටීමේ වේදනාව සියල්ලටම වඩා දරුණු ය.

"ඊයෙ සුනෙත් ඇවිත් ගියා.. සර් හිටියෙ නැති නිසා ආයෙම එන්නං කිව්වා.. එයා තවත් එක්සිබිෂන් එකකට ලෑස්ති වෙනවා.." ශාමිලා කලාගාරය අස්පස් කරන අතර කීවා ය.

"මේ තරම් ඉක්මනට..?"

"ඒක තමයි මාත් හිතුවෙ.. කලින් එක්සිබිෂන් එක තියලා මාස කීයද ගියේ"

"ආප්ප බානවා වගේ පේන්ටිංන්ගිස් කරනවට මම කැමති නැහැ.. කඩිමුඩියෙ පේනිටිංන්ග්ස් ඉවර කරගෙන එක්සිබිෂන් තියන්නෙ සල්ලි හොයන්න මහන්සිවෙන ආටිස්ට්ලා.. මගේ ගෝලයො එහෙම වෙනවට මං කැමති නෑ.." විශ්වජිත් හිස් තේ කෝප්පය සෝදන අතර කීවේ ය. ශාමිලා හිස් තේ කෝප්පය ගන්නට අත දිගු කළ නමුත් ඔහු ඇය මග හැරියේ ය.

"මං සෝදලා තියන්නං... ඔය වැඩ කළා ඇති... පාඩම පටන්ගන්න.. මං අද දවසම ඉන්නවා.." ඔහු කීවේ ය.

ශාමිලා තමා පසුගිය දිනවල සිත්තම් කරමින් සිටි සිත්තම සහිත කැන්වසය ඊසලයක් මත සවි කළා ය. මේ සිත්තම "භාවනා" නමින් නම් කරන්නට ඇය සිතා සිටියා ය. අසම්මත ආකෘතියකට අනුව මූලිකව කහ සහ තැඹිලි පැහැයෙන් කැන්වසය මත මැවෙමින් තිබූ සිත්තමේ හැඩ තල මතු කරමින් තිබූ ශාන්ත භාවයට ඒ නම කදිමට ගැලපේ යයි ඇය සිතුවා ය.

ඇය අසළින්ම සිටගත් විශ්වජිත් සිත්තම හොඳින් නිරීක්ෂණය කළේ ය. මේ දක්වා ඇය විසින් නිම කරනු ලැබ තිබූ වැඩ කොටස ඔහුගේ සිත් ගත්තේ ය.

"හුගක් හොඳයි.. දිගටම කරගෙන යන්න.. මම සැරින් සැරේ ඇවිත් බලන්නම්.." ඔහු කීවේ සිය සතුට නොසඟවා ගනිමින් ය.

බොහෝ කලකට පසුව ශාමිලා මහත් තෘප්තියකින් යුතුව කැන්වසය මත වර්ණ හැඩ තල මතු කරමින් සිටියා ය. විශ්වජිත් සතුටින් සිටිනු දැකීමේ සතුට මෙතරම් වේ යයි ඇය කිසිවිටෙක නොසිතුවා ය.

සතුට ත්‍යාගයකි. ඒ ත්‍යාගය නිර්ලෝභී ලෙස බෙදා හළ යුතු ය. දෝරේ ගලා යන සතුට තැවරුණේ කැන්වස් තිරය මත ය.

**ළබන කළාපයට**

# ශ්‍රීලාල් ගේ කොළම

## කැරලිකරුවන්ගේ මරණ

ඉල් මහේ විරු සමරුව වෙනුවෙන් ඉරිදා ලංකාදීප පත්තරේ පළවුණ ලිපියක් භීෂණ සමයේ අඳුරු මතකයන් ආයෙත් අවදි කළා. ලිපියක් කිව්වට මොකද ඒක සම්මුඛ සාකච්ඡාවක්. රෝහණ විජේවීර ඝාතනය සියැසින් දුටු එවක යුද හමුදා පොලිසියේ ඡායාරූප ශිල්පියෙකු සමඟ සාකච්ඡාව කරලා තිබුණේ ප්‍රසන්න සංජීව මිත්‍රයා.

යුද හමුදාවේ 'රණවිරුවෝ' විජේවීර පනපිටින් ගෑස් චිමිනියට දාලා පුච්චපු හැටි යුද හමුදා පොලිසියේ හිටපු ඡායාරූප ශිල්පියා විස්තර කරලා තිබුණා. මේ කතාව මීට කලිනුත් අහලා තිබුණ එකක්. ඒත් මොන හේතුවක් නිසා හරි පැහැදිලිව මතකයේ රැඳිලා තිබුණේ නෑ. පැහැදිලිව මතකයේ රැඳිලා තිබුණේ ආණ්ඩුව නිර්මාණය කරලා මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කළ 'චිත්‍රපටි' කතාව.

ඒ කතාවෙන් කියැවුණේ විජේවීර අත්අඩංගුවේ ඉන්නකොට ඇතිවුණ වෙඩි හුවමාරුවකදී ඔහු මියගියා කියලා. මට මතක විදිහට විජේවීර හරි ඔහු සමඟ අත්අඩංගුවට පත්වෙලා හිටිය සගයෙක් හරි හමුදාවේ 'රණවිරුවෙකුගේ' ගිනි අවියක් උදුරාගෙන වෙඩි තියන්න හදලා තියන කතාවක් තමයි කිව්වෙ. ඒ වෙලාවෙදි 'රණවිරුවෝ' ආත්මාරක්ෂාව වෙනුවෙන් අවම බලය පාවිච්චි කළාම විජේවීර මියගිහිල්ලා. හරියට දැන් නිතර නිතර පොලිසියෙන් අහන්න ලැබෙන 'සැඟවූ අවි' පෙන්නන්න පාතාල සැකකරුවන් ගෙන ගියාම සිද්ධවෙනවා වගේ දෙයක් තමයි වෙලා තියෙන්නේ. පව්. වෙඩි වැදුනට පස්සේ වුණත් 'රණවිරුවෝ' ගොඩක් මහන්සි වෙන්න ඇති විජේවීරගේ ජීවිතය බේරගන්න. ජාතික රෝහලටත් ගෙනියන්න ඇති සමහර වෙලාවට. දැඩි සත්කාර ඒකකයටත් දැම්මද දන්නෙත් නෑ. ඒත් බේරගන්න බැරිවෙන්න ඇති. ජනමාධ්‍ය ප්‍රචාරක අනුග්‍රහය දක්වපු ආණ්ඩුවේ 'චිත්‍රපටි' කතාව ඇහෙනකොට එහෙමත් හිතෙන තරම්.

ඒත් ඇත්ත මොකක්ද? හමුදාව විජේවීර අත්අඩංගුවට ගත්තා. අවශ්‍ය තොරතුරු ගත්තා. අමු අමුවේ පුච්චලා මැරුවා. ඒකයි ඇත්ත. නමුත් ඇත්ත මතුවෙන්නේ කාලෙකට පස්සේ. එතකොට ඒකෙන් සමාජයට ඇතිවෙන බලපෑමක් නැති තරම්. විජේවීර විතරක් නෙවෙයි. 'රණවිරුවො' අත් අඩංගුවට ගත්ත තරුණ තරුණියන්ගෙන් විශාල පිරිසකට අත්වුණේ මේ ඉරණම කියන එක රහසක් නෙවෙයි. නිල නොලත් සංඛ්‍යාලේඛන අනුව 88/89 අවුරුදු දෙකේ 'රණවිරුවෝ' මරා දැමූ කළ කොල්ලන් කෙල්ලන්ගෙ ගණන හැටදාහක්.

මේ ඡායාරූප ශිල්පියා කියලා තිබුණා අද ජනතා විමුක්ති පෙරමුණේ ඉන්න කිසිම නායකයෙක් විජේවීරගේ මරණය ගැන වචනයක් වත් මේ වෙනකම් එයාගෙන් අහලා නැතිලු. විජේවීරගේ මරණය ගැන කොමිසමක් ඉල්ලන්න කියලා ජවිපෙ නායකයන්ගෙන් අවස්ථා ගණනාවකදීම ඉල්ලුවත් ඒක කළෙත් නැතිලු. ඒ වුණාට ඉතිං ඒ අය වාර්ෂිකව විරු සමරුව පවත්වලා විජේවීර ගැන සමාජයේ මතකය අලුත් කරනවානේ. ඒ මදැයි දෙයියනේ තමන්ගේ පැවැත්මට. නේද? විජේවීර මැරුණේ කොහොමද කියලා ආයේ කොමිසන් දාගෙන හොයන්න දෙයක් තියනවයැ කියලා ඒ අය හිතනවා ඇති. අනික ඒ විදිහේ කොමිසන් ඉල්ලන එක 'රටටත්' 'ජාතියටත්' කරන මහා ද්‍රෝහිකමක් නෙවෙයිද? දැඩි විනයක් තියන ලෝකයේ ඉන්න විනය ගරුකම හමුදාවක් වන අපේ 'රණවිරුවන්ගේ' කීර්ති නාමය කෙළෙසන ජාත්‍යන්තර කුමන්ත්‍රණයක කොටස්ක-රුවන් වෙන්න ජවිපෙ නායකයන්ට පුළුවන්ද? හරියට අවසන් සටනෙදි මැරුණ එල්ටීටීඊ නායකයන්ගේ මරණ ගැන පරීක්ෂණ ඉල්ලනවා වගේ දෙයක් වෙනවනේ ඒක.

විජේවීරගේ මරණය ගැන මතක්වෙන හැම වෙලාවකම වගේ ඒත් එක්කම මට මතක් වෙන්නේ ප්‍රභාකරන්ගේ මරණය. විජේවීර කියන්නේ දකුණේ සිංහල නූතන කැරලි නායකයා. ප්‍රභාකරන් කියන්නේ උතුරේ දෙමළ නූතන කැරලි නායකයා. විජේවීර වගේ නෙවෙයි ප්‍රභාකරන් අවස්ථා ගණනාවකදීම මියගියා. ඒ මරණ හැම එකක්ම ජනමාධ්‍ය ඉහළින්ම වාර්තා කළා. අවසන් සටනෙදි වෙල්ලමුල්ලිවයික්කාල්වලදි මැරෙන්න අවුරුදු කීපයකට කලින් ප්‍රභාකරන් මැරුණේ සුනාමියෙන් ඔහුගේ කඳවුර යටවුණ දවසේ.

අන්තිම සටනෙදි ප්‍රභාකරන් මියගිය හැටි අපිට කිව්වේ රජයේ අනුග්‍රහයෙන් සටන් බිමට ගිහින් සජීවි වාර්තාකරණයක නිරතවුණ ජනමාධ්‍ය සොල්දාදුවන් කීප දෙනෙක්. මේ අය ගෙනෙන සජීවී වාර්තා බලන්න අපි දවස පුරාම රූපවාහිනිය ක්‍රියාත්මක කරලා තිබුණා. (සටන් බිමෙන් තොරතුරක් ලැබෙන වෙනත් ක්‍රමයක් නොතිබුණ නිසා.) අවසන් සටනේ අවසානයට දවස් දෙකකට කලින් ප්‍රභාකරන් මියගියේ ගිලන්රථයක නැගලා පැනලා යන්න යන වෙලාවේ 'රණවිරුවන්'ගේ ප්‍රහාරයකින්. ඊට පස්සේ ප්‍රභාකරන් මියගියේ සටන්බිමේදි 'රණවිරුවන්ගේ' ප්‍රහාරයකින්. විජේවීරගේ මරණය ගැන කියපු 'චිත්‍රපටි' කතාවලට වැඩිය ප්‍රභාකරන්ගේ මරණය ගැන කියපු 'චිත්‍රපටි' කතා වෙනස්. නමුත් විජේවීරගේ වගේම ප්‍රභාකරන්ගේ අවසාන මොහොත දැකපු අය නැතිවා නෙවෙයි. ඒත් ඒ කිසිම කෙනෙක් තවමත් ඒ ගැන කට ඇරලා නෑ. සමහර වෙලාවට කවදාහරි දවසක කවුරු හරි කෙනෙක් ප්‍රභාකරන් ඝාතනය වුණ ආක-ාරයත් අපිට කියයි. ඒත් ඒ වෙනකොට ඒ අනාවරණයෙන් සමාජයට සිදුවන කිසිම බලපෑමක් නැතිවේවි.

ශ්‍රීලාල් සෙනෙවිරත්න.